# 2020 වර්ෂයේ විගණන හා විමර්ශන ප්‍රගතිය

| ආයතන | සිදු කල පරීක්ෂණ සංඛ්‍යාව | නිකුත් කල වාර්තා සංඛ්‍යාව | පිළිතුරු ලැබුණු සංඛ්‍යාව | එකඟතාවය ලබාදුන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය | 67 | 62 | 43 | 37 |
| ඌව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය | 25 | 22 | 18 | 15 |
| ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය | 21 | 18 | 14 | 11 |
| ඌව පළාත් මාර්ග අමාත්‍යාංශය | 11 | 09 | 08 | 05 |
| ඌව පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය | 09 | 07 | 04 | 03 |
| අමාත්‍යාංශ යටතට නොගැනෙන අනෙකුත් ආයතන | 14 | 13 | 05 | 03 |
| එකතුව | 147 | 131 | 92 | 74 |

# උඃව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු සහ සමාජ සුභසාධන අමාත්‍යාංශය

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
|---|---|
| ඖෂධ පරිපාලනය<br><br>i. ඖෂධ ගබඩාකරණය (Drug Storage)<br>ii. කල් ඉකුත් වූ ඖෂධ (Expired drugs)<br>iii. ගුණාත්මකභාවය අසමත් වූ ඖෂධ (Quality Failure Drugs) | සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මේ වන විට පවතින අධික රාජකාරීන් හේතු කොට යම් ප්‍රමාණයකින් කල් ඉකුත් වූ ඖෂධ අපහරණය කිරීම වැනි තත්ත්වයන් නිරීක්ෂණය වේ. |

| නිරීක්ෂණය වූ තත්ත්වය | වර්තමාන නිරීක්ෂණ |
| --- | --- |
| සෞඛ්‍ය උපකරණ, ද්‍රව්‍ය භාවිතය හා නඩත්තු කිරීම | සැලකිය යුතු මට්ටමකින් පෙන්වා දුන් තත්ත්වයන් මඟහරවා ගැනීමට වගකිව යුතු පාර්ශවයන් කටයුතු කර ඇති බවක් නිරීක්ෂණය වේ. |

1. **<u>බඩල්කුඹුර ප්‍රාදේශීය රෝහල</u>**
**<u>මුල් විගණන අවස්ථාව.</u>**

- **2017/01/06 දින මෙම රෝහල සඳහා ලබාදී තිබූ රු. 543,900.00 ක මුදලක් වටිනා ජෙනරේටරයක් ලබාදී තිබූ අතර නිෂ්ප්‍රයෝජනවත්ව වසර දෙකකට ආසන්න කාලයක් පවතින බව විගණනය විසින් වාර්තා කරන ලදී.**




**ඒ වන විට මෙම රෝහලේ විදුලිය නොමැති විට විදුලි පහසුකම් සපයා ගත හැකි වෙනත් ක්‍රමවේදයක් සකස් කර නොතිබූ අතර හදිසි විදුලි ලාම්පුද ක්‍රියාත්මක නොවීම මත මෙම රෝහලේ වාට්ටු 04 සඳහා විදුලිය නොමැතිවූ විට චිමිනි ලාම්පු භාවිතා වී තිබුණි.**





**<u>මෙම තත්ත්වය පෙන්වාදීමෙන් පසු</u>**

- **50 KVA ජෙනරේටරයක් මෙම රෝහල වෙත ලබාදීමට කටයුතු කරනු ලැබීය.**



**මෙයද ප්‍රයෝජනයට නොගෙන ආවරණයක් හෝ නොමැතිව පවතින බව පසු විපරම් විගණනයෙන් පෙන්වා දෙන ලදී.**

## පසුගිය පළාත් කමිටු අවස්ථාවේ පැවති තත්ත්වය





මේ අවස්ථාව වන විට ජෙනරේටරය සඳහා ආවරණයක් සකසා පැවති අතර විදුලි සැපයීමට අවශ්‍ය වයර් ඇදීම සිදුකර තිබුණද එමඟින් විදුලිය සපයා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා නොතිබුණි.

## වර්තමාන තත්ත්වය පසු විපරම් විගණන පරීක්ෂණය - අවි/39/2020/22 - 2020.12.24



මේ වන විට මෙම ජෙනරේටරයෙන් විදුලිය නොමැති අවස්ථා වල විදුලිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර පවතින බව නිරීක්ෂණය විය.

# <u>බුත්තල දිසා රෝහල.</u>

මෙම රෝහලේ වාට්ටු අංක **5** න් නිකුත් වන අප ජලය විවෘත කාණු හරහා මැණික් ගඟට බැහැර වේ. මීට පෙර විගණන අවස්ථා කිහිපයකදී මෙම තත්ත්වය පෙන්වා දුන්නද විගණන දින වන විටද ඊට අදාළ කටයුතු සිදුවී නොමැති බව නිරීක්ෂණය විය. මෙවැනි තත්ත්වයන් බොහෝ පිරිසක් රෝගීන් බවට පත්කිරීමට දායක වන බැවින් මේ සම්බන්ධව කටයුතු සිදු නොවීම එකඟ විය හැකි තත්ත්වයක් නොවන බව පෙන්වා දෙමි.







එමෙන්ම කොවිඩ් ආසාධිතයින් සඳහා සකස් කරමින් පවතින වාට්ටුවලින් පිටවන ජලය විවෘත කාණු හරහා ඉහත පෙන්වා ඇති වලට එකතු වන ලෙස පවතින ආකාරයක් නිරීක්ෂණය වන අතර අදාළ වාට්ටු රෝගීන් සඳහා විවෘත කරන අවස්ථාව වන විට හෝ මෙම තත්ත්වය නිරාකරණය නොකරන්නේ නම් අවධානම් තත්ත්වයක් ඇතිවන බව පෙන්වා දිය හැකිය.










## බඩල්කුඹුර ප්‍රාදේශීය රෝහල.

මෙම රෝහලෙන් පිටවන අප ජලය කාණු පද්ධතිය ඔස්සේ ඇල මාර්ග වලට එකතු වී එමඟින් මඩුකොටන් ආරේ ඔයට එකතු වන බව නිරීක්ෂණය විය. මේ සඳහාද නිසි ක්‍රියාමාර්ග විගණන දින දක්වා සිදුවී නොමැති බවද අනාවරණය විය.






# භාවිත කරනු ලබන වැසිකිළි









# භාවිතයෙන් තොරව වසා දමා ඇති වැසිකිළි ඒකක







මෙයින් එක් වැසිකිළි ඒකකයක් තුළ සැළකිය යුතු කාලයකට ඉහතදී භාවිතා කොට තිබූ බදුන තුළ එක්රැස් වී පැවති ජලයේ මදුරු කීටයින් විශාල වශයෙන් සිටින අයුරුද නිරීක්ෂණය විය.

